**කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

---

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමයට ඉදිරිපත් කිරීමේදී මුදල් ගැලපුම් වලට බලනොපාන රු. 32,914,139 ක් වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට නැවත එකතු කර නොතිබුණි. එසේම කාරක ප්‍රාග්ධන වෙනස් වීම් යටතේ දක්වා තිබුණු විෂයයන් 05 කට අදාළ තථ්‍ය කාරක ප්‍රාග්ධන විචලතාව හා ඊට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වටිනාකමත් අතර රු. 81,546,424 ක වෙනසක් විය. | ඉදිරියේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ කරනු ලබන ගැළපීම් නිවැරදිව ඉදිරිපත් කරමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති, සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 7,367,999 ක වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු නොකර ඉහත වත්කම් වලින් වත්කම් පන්ති 04කට අදාළ පිරිවැය රු. 4,162,725ක් වූ වත්කම් පමණක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි නියමයන්ට පටහැණිව එහි පිරිවැයටම නැවත ප්‍රත්‍යාගණනය කර පෙර වර්ෂ ගැලපීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම දැනට පිරිවැය අගය ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු රු. 79,193,786 ක් වූ වත්කම් වලින් දැනටමත් භාවිතා කරනු ලබන හා භාවිතයෙන් ඉවත් කර ඇති වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 92 ඡේදය ප්‍රකාරව වෙනමම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව දේපල පිරියත හා උපකරණ මූල්‍ය වර්ෂය අවසානයේදී පිරිවැය ක්‍රමයට හඳුනා ගන්නා නිසා සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය සිදු නොකරන බවත්, වාර්ෂිකව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොමැති බව සහ 2021 වර්ෂයේ අවසාන ගිණුම මඟින් නිවැරදිව ඉදිරිපත් කරමි. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂිකය ගණනය කිරීම සඳහා වෘත්තිකයෙකුගෙන් තක්සේරුවක් ලබා ගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය අවසානයට ආයු ගණන ශිල්ප ක්‍රමය පරිදි රු. 5,977,630 ක් අඩුවෙන් පාරිතෝෂිකය ගණනය කර ගිණුම්ගත කර තිබුණි. | වෘත්තිකයෙකු යොදවා ගැනීම සඳහා විශාල මුදලක් වැයවන නිසා වෘත්තිකයකුගේ රේටයන් යොදා ගෙන පාරිතෝෂිකය ගණනය කළෙමි. | ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 ප්‍රකාරව ආයතනයට විවිධ පාර්ශව වලින් ලබෙන ආධාර හා ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර දැනටමත් ආයතනයට ලැබී තිබුණු රු. මිලියන 514 ක් වූ ආධාර සම්බන්ධයෙන් ආධාර ලබාදීමට අදාළව ආයතනයට ඇති බැඳීම් හා වගකීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ආධාර හා ප්‍රදාන ලැබීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නොනිම් වැඩ වටිනාකම රු. 51,743,291 ක් වුවද එම නොනිම් වැඩ යටතේ දක්වා තිබුණු වත්කම් වලින් පිරිවැය රු. 43,246,410ක් වූ වත්කම් ආයතනය විසින් භාවිතයට ගෙන තිබුණි. එමනිසා වත්කම්වල ක්ෂය වියදම හා භාවිතා කරනු ලබන වත්කම්වල අගය ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම මඟින් නිවැරදි වටිනාකම ඉදිරිපත් කරමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට කෙසෙල් පැළ නොනිම් වැඩ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සහ ලෙජරයේ පිළිවෙලින් රු. 68,970 ක් හා රු. 758,093 ක් ලෙස එකිනෙකට වෙනස් අගයන් දක්වා තිබීම හේතුවෙන් එම අගයන් අතර රු. 689,123 ක වෙනසක් නිරීක්ෂණය වුවත් එයට හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකෙරුණි. එසේම සමාලෝචිත වර්ෂයේ අවසානයට ආරාධිත දේශන සඳහා ගෙවිය යුතු රු. 202,500 ක දේශන ගාස්තු වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසාන ගිණුම මඟින් නිවැරදි වටිනාකම ඉදිරිපත් කිරීමට සහ 2020 වර්ෂයේ අවසාන ගිණුම පිළියෙල කරන තෙක් ඉදිරිපත් කළ වියදම් පමණක් ගිණුම්ගත කළෙමි. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමටත් වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 ඔක්තෝබර් 16 දිනැති අංක 157 1/15 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 5 (ii) සහ (iii) වගන්තිය | නියමාවලිය අනුව ශාස්ත්‍රීය මණ්ඩලයක් සහ අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කළෙමි. | අති විශේෂ ගැසට් පත්‍රයේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (ආ), (ඇ) සහ 1646 | සමාලෝචිත වර්ෂයේදී ආයතනය සතු වාහන 08 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත කාල පරිච්ඡේදය තුළ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1978 ජුනි 26 දිනැති අංක 09 දරණ සැපයුම් හා මුදල් චක්‍රලේඛය සහ 1996 සැප්තැම්බර් 16 දිනැති අංක 689 දරණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් කාණ්ඩ 04 කට අදාළ නිලධාරීන් 39 දෙනෙකුට නිල ඇඳුම් හා ආවරණ පිළි නිසි පරිදි තීරණය කොට නිකුත් කිරීමටත් මැහුම් කුලී ප්‍රතිපූර්ණය කිරීමටත් කටයුතු කළ යුතු වුවත් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බවත්, 2021 වර්ෂයේදී සියලුම සේවකයින් සඳහා නිල ඇඳුම් ලබා දුන්නෙමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1995 ජූලි 14 දිනැති අංක 636 දරණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අධ්‍යයන කටයුතු වලට අදාළ විභාගයන්හි ප්‍රතිඵල මාස 03 ක් ඇතුළත නිකුත් කළ යුතු වුවත්, ආයතනය විසින් 2019 වර්ෂයේ පවත්වන ලද විභාග 09 ක ප්‍රතිඵල නියමිත පරිදි නිකුත් කර නොතිබු අතර ප්‍රමාද කාලය දින 39 සිට දින 238 ත් අතර විය. | මේ වන විට නියමිත කාලයේදී ප්‍රතිඵල නිකුත් කිරීම සිදු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 16,973,994 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. 6,993,247 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 23,967,241 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රාජ්‍ය ප්‍රදාන ලැබීම රු. 14,650,000 ක් වැඩිවීම , වත්කම් ප්‍රත්‍යාගණන ලාභය රු. 8,948,437 ක් වැඩිවීම , පාඨමාලා ගාස්තු ආදායම රු. 3,794,441 ක් වැඩිවීම , පැළ විකුණුම් ආදායම රු. 1,075,328 ක් වැඩිවීම සහ වර්ෂයේ වැටුප්, වේතන හා ක්ෂය වියදම වැඩිවීමේ එකතු වටිනාකම වූ රු. 17,108,604 ක් ඉක්මවා ගමන්වියදම් , මිලදීගැනීම් හා පාරිතෝෂික අධිවෙන්කිරීම නැවත ගැලපීමේ වියදම් අඩුවීමේ එකතු වටනාකම වූ රු. 11,809,579 ක් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ආයතනයේ සත්ත්ව පාලන හා කෘෂි අංශය සඳහා කළමනාකරුවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම අංශයට අදාළ සියලුම කාර්යයන් එක් සේවකයෙකු විසින් සිදු කර තිබුණු අතර එම කාර්යයන් විධිමත් අධීක්ෂණයකට ලක්ව නොතිබීමෙන් මේ සම්බන්ධයෙන් ස්ථාපිත අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි. තවද වර්ෂය අවසානය වන විටත් තොග සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2021 වර්ෂයේදී මෙම අංශයේ අධීක්ෂණ කටයුතු සඳහා වැඩ බලන ගොවිබිම් කළමනාකරුවෙකු පත් කළෙමි. | කාර්යයන් හඳුනා ගෙන වැඩ බෙදීම, අධීක්ෂණය කිරීම සහ තොග සමීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භාණ්ඩ වර්ග 10 කට අදාළව අතිරික්තතා වර්ග 160 ක් පැවති අතර ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් කළමනාකාරිත්වය විසින් ගෙන නොතිබුණි. | කොවිඩ් 19 වසංගතයට පෙර ශිෂ්‍යයන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ වලට නිකුත් කරන ලද අයිතමයන් වන බවත්, සිසුන් පැමිණීමෙන් පසු එම භාණ්ඩ ගබඩාවට ලබා ගන්නෙමි. | අතිරික්තතා හඳුනාගෙන තොග ලේඛන යාවත්කාලීන කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත්තුවක ගිවිසුම්ගත කාලය දීර්ඝ කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන හේතුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමෙන් පසු දින දීර්ඝ කිරීම් කළ යුතු වුවත්, එකතු වටිනාකම රු. 143,712,947 ක් වූ කොන්ත්‍රාත් 04 කට අදාළව එපරිදි කටයුතු නොකළ අවස්ථා පැවති අතර එම කොන්ත්‍රාත්වලට අදාළව කාර්සාධන බැඳුම්කරයේ කාලය දීර්ඝ කර ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලද බවත්, එය අනුමැතිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ බව සහ ප්‍රමාද ගාස්තු අය කිරීමට මෙතෙක් තීරණයක් ගෙන නොමැති බව. | දින දීර්ඝ නොකළ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව දඩ අය කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති සේවක පුරප්පාඩු 30 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු සඳහා 2021 මාර්තු 01 දින වන විට බඳවා ගත් බවත්, අනධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු බඳවා ගැනීමට කටයුතු කරමි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |